## ISO ප්‍රමිතීන් සඳහා අනුකූලතාවය

ISO 9001 (තත්ත්ව) ISO 14001 (පාරිසරික) කළමනාකරණ පද්ධති ප්‍රමිතීන් සඳහා අනුගත වන සේ OHSAS 18001 ප්‍රමිතිය එළිදක්වා ඇති අතර මෙහිදී ආයතනයක් අනුගමනය කල යුතු තත්ත්ව, පාරිසරික සහ වෘත්තිය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා අවශ්‍යතාවයන් එකට ගොනු කර ඇත.

## OHSAS 18001 සහතිකය ලබාගැනීමෙන් අත්වන වාසි

- අනවශ්‍ය මෙහෙයුම් පිරිවැය සහ වැඩපල තුලදී ඇතිවිය හැකි අනතුරු සහ රෝගාබාධ අවම වීම.
- නීතිමය ගැටළු පාලනය කිරීමේ හැකියාව වර්ධනය වීම.
- නීති කෙටුම්පත් ආයතන / අධිකාරි, සේවක සහ පාරිභෝගික නීතිමය අවශ්‍යතා මනාව කළමනාකරණය කිරීමේ හැකියාව වර්ධනය වීම.
- පොදු වගකීම් සඳහා වන ආරක්ෂණ වියදම් අවම වීම.
- ආයතනයේ සාමූහික ක්‍රියාකාරිත්ව ප්‍රතිරූපය වර්ධනය වීම තුලින් නව පාරිභෝගිකයන් සහ වෙළඳ හවුල්කරුවන් ආකර්ෂණය වීම.

## සහතිකය ලබාගන්නේ කෙසේද ?

- ආයතනයේ වෘත්තිය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා ප්‍රතිපත්ති එළිදැක්වීම.
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් අදාල අයදුම්පත්‍රය සහ ලේඛණ ලබාගැනීම.
- නිසි අයුරින් සම්පූර්ණ කල අයදුම් පත්‍රය සහ වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිතතා සංග්‍රහය භාරදීම.
- ඇගයීම් කිරීම සහ සවිස්තරාත්මක වාර්ථාව භාරදීම.
- විගණන වාර්තාවේ නුසුදුසුතාවයන් සඳහන් වෙතොත් ඒවා නිවැරදි කිරීම.
- පළමු විගණනය සඳහා කැඳවීම සහ **OHSAS 18001** පද්ධති විගණන වාර්තාව ලබාගැනීම.
- පළමු විගණනයට අදාල නුසුදුසුතාවයන් නිවැරදි කිරීම.
- අවසාන විගණනය සහ විගණන වාර්තාව ලබාගැනීම. අවසාන විගණනයේ නුසුදුසුතාවයන් නිවැරදි කිරීම. සහතික පත්‍රය ලබාගැනීම.
- වසරකට වරක් පිරිස්සුම් විගණන පැවැත්වීම.

## සහතිකකරණ ක්‍රියාවලිය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සතු සුවිශේෂිත්වය

- මනා පුහුණුවලත් ප්‍රවීන විගණන කණ්ඩායම් විගණන ක්‍රියාවලිය මෙහෙයවීම.
- ජාත්‍යන්තර මාර්ගෝපදේශයන්ට අනුකූල වනසේ ස්ථාපිත නීති රෙගුලාසි භාවිත කිරීම.

විමසීම්
වී ජී පී ධර්මවර්දන
අධ්‍යක්ෂ - පද්ධති සහතිකකරණ අංශය
ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
නො. 17, වික්ටෝරියා පෙදෙස, ඇල්විටිගල මාවත,
කොළඹ 8. දුරකථන : 011-2671567-72
දුරකථන/ෆැක්ස් : 011-2672613 ඊමේල් : dsc@slsi.slt.lk

# OHSAS 18001

Occupational Health and Safety
OHSAS
18001
SLSI
System Certified



# වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය

පද්ධති සහතිකකරණ අංශය
ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

# OHSAS 18001
# OHSAS 18000 කාණ්ඩය

OHSAS 18000 කාණ්ඩය වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා කළමනාකරණය සඳහා වන පද්ධතීන් වලින් සමන්විත වන අතර ඕනෑම ආයතනයක් සඳහා අනුගමනය කල හැකි වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා කළමනාකරණ ප්‍රවේශය සඳහා නිර්මිත අවශ්‍යතා වලින් යුක්ත වේ.

## වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතියක් යනු කුමක්ද ?

- ආයතනයක ක්‍රියාකාරිත්වය හා බැඳි පවත්නා වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා අවදානම් අවස්ථාවන් කළමනාකරණය සඳහා උපකාරී වන්නා වූ සමස්ත කළමනාකරණ පද්ධතියේ එක් අංශයකි.

- ආයතනික ව්‍යුහය, සැලසුම් කිරීම්, වගකීම්, භාවිතයන්, ක්‍රමවේදයන්, ක්‍රියාවලීන් සහ ආයතනික සම්පත් ආදී අංග මෙහිදී සලකා බලනු ලැබේ.

- ආයතනයේ වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, වර්ධනය කිරීම, ලඟාකර ගැනීම, සමාලෝචනය සහ පවත්වා ගෙනයාම සඳහා ඉහත අංගයන්හි ක්‍රියාකාරිත්වය මෙහිදී සලකා බලනු ලැබේ.



## වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතාව සඳහා වන ප්‍රමිතීන්

OHSAS 18000 ප්‍රමිති කාණ්ඩය කොටස් 2 කින් යුක්ත වේ.

**OHSAS 18001:2007**
වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා වන අවශ්‍යතා වලින් යුතු වේ.

**OHSAS 18002:2000**
OHSAS 18001 ක්‍රියාත්මක කිරීම සඳහා වන වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති මාර්ගෝපදේශය සපයනු ලබයි.

## විෂය ක්ෂේත්‍රය

වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම මගින් ආයතනික ක්‍රියාකාරිත්වය නිසා ජනිත වන්නාවූ වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා අවදානම් අවස්ථා සඳහා ආයතනයේ සේවයේ නියුතුවන්නන් සහ අනිකුත් ආයතනික පාර්ශවකරුවන් නිරාවරණය වීම, අවම කිරීම හෝ මග හැරීම සිදු කරනු ලැබේ.

තවද

- මෙහිදී වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති අවශ්‍යතා ක්‍රියාත්මක කිරීම, පවත්වා ගෙන යෑම සහ නිරන්තර අභිවෘද්ධිය සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබේ.

- වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා ප්‍රතිපත්තිය සඳහා අනුගත වීම තහවුරු කරනු ලැබේ.

- බාහිර ආයතනයකින් හෝ පාර්ශවයකින් ආයතනික වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය සඳහා පිළිගැනීම/සහතිකකරණය ලබාගත හැකි වීම හෝ

- ආයතනය වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා කළමනාකරණ අවශ්‍යතා සඳහා පූර්ණව අනුගත වී ඇති බවට ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ හැකියාව ලැබේ.

## OHSAS 18001 කළමනාකරණ මූලිකාංග

